**ශීර්ෂය 166- ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාළ නිරීක්ෂණ දක්වා ඇත.

## 1.1 විගණන විෂය පථය

ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 27 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්
-------

### 2.1 විසර්ජන ගිණුම්
----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**
----------------------------

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 30,815.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 27,249.28 ක් උපයෝජනය කර තිබුණි. ඒ අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,566.57 ක් හෙවත් සියයට 11.57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 214.75 | 209.99 | 4.76 | 2.22 |
| මූලධන | 30,601.10 | 27,039.29 | 3,561.81 | 11.64 |
| එකතුව | **30,815.85** | **27,249.28** | **3,566.57** | **11.57** |

### 2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම
-----------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**
-------------------------------------------------

අමාත්‍යාංශයට අදාල විෂය අංක 16601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 4.80 | 4.75 | 2.00 | 2.91 | 20.00 | 13.10 |

### 2.3 පොදු තැන්පත් ගිණුම
------------------------

අමාත්‍යාංශය යටතේ ඇති අංක 6000/0000/00/0015/0076/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 18.71 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා හා පොත් අනුව ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

**ප්‍රතිපාදන ඌන උපයෝජනය**

වැය විෂයයන් 22 ක් සඳහා සළසා තිබුණු රු.මිලියන 5,335 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,107 ක් උපයෝජනය කර නොතිබුණි. භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අග්‍රිම නොලැබීම, කොන්ත්‍රාත් පිරිනැමීමේදී වූ ඌනතා හා භාණ්ඩාගාරයට වියදම් වාර්තා කිරීමේ ප්‍රමාද වීම නිසා එම ඉතිරියන් සිදු වී තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2005 දෙසැම්බර් 10 දින සිට වැඩ තහනමට ලක් වූ නිලධාරියකුගේ රු.38,095 ක හිඟ ණය ශේෂය අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුණි. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 ජුනි 07 දිනැති අංක ඩී.පී/4/08/2006 දරන ලිපියට අනුව, එම නිලධාරියා වැඩ තහනමට ලක්වූ නිලධාරියකු නොවූ අතර, සේවයෙන් පහකළ මෙම නිලධාරියාගේ හිඟ ණය ශේෂය අමාත්‍යාංශ ලේකම්ගේ 2015 අගෝස්තු 12 දිනැති පිළිතුරු ලිපිය ප්‍රකාරව ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 අරමුණුවලට පරිබාහිර කාර්යයන් වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රතිපාදන වියදම් කිරීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දින අමාත්‍යාංශය සඳහා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් 3 ක් රු.493,500 ක් වැය කර සවිකර තිබුණි. එම වියදම සංවර්ධන වැඩසටහනේ යාපනය සහ කිලිනොච්චි ජලසම්පාදන ව්‍යාපෘතිය යටතේ විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය (17) මූල්‍යකරණ ප්‍රභවය යටතේ වන වැය විෂයයක් යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ අනුව විදේශ

ව්‍යාපෘතියකට අදාළ ප්‍රතිපාදන අමාත්‍යාංශ අවශ්‍යතාවයක් වෙනුවෙන් උපයෝජනය කර ගෙන තිබුණි.

(ආ) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව පිහිටුවීම හා ඒ සම්බන්ධ වන වියදම් 166-2-3-17-2502(11) දරන සංවර්ධන වැඩසටහන යටතේ වැය විෂයය යටතේ රු.13,830,204 ක් වැය කර තිබුණි. ඉන් රු.5,093,356 ක් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 2014 නොවැම්බර් 17 දින අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ප්‍රජාමූල සංවිධාන නියෝජිතයින්ගේ විශේෂ රැස්වීම සඳහා වැය කර තිබුණි. එය අදාළ වැය විෂය යටතේ වූ වියදමෙන් සියයට 36.8 ක් වී තිබුණි.

(ඇ) කළු ගඟ ජලසම්පාදන ව්‍යාපෘතියේ විෂය පථයට සනීපාරක්ෂක කාර්යයන් ඇතුළත්ව නොතිබුණද, එම ව්‍යාපෘතියේ දේශීය අරමුදල්වලින් අමාත්‍යාංශයට ලබාගත් රු. මිලියන 5 කින් රු. මිලියන 4.3 ක් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රදේශවල අඩු ආදායම්ලාභී නිවාස සඳහා වැසිකිළි පහසුකම් සැපයීමට වැයකර තිබුණි. එම වියදම තුළ කළු ගඟ ජලසම්පාදන ව්‍යාපෘතියෙන් ජලය සැපයීමක් සිදු නොවන ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රදේශවල වැසිකිළි පහසුකම් සැපයීමට වැය කළ රු. 670,800 ක්ද ඇතුළත්ව තිබුණි.

(ඈ) ප්‍රති ආශ්‍රිත යන්ත්‍ර (ජල පෙරන යන්ත්‍ර) සපයා සවිකරදීමට විදේශීය ආයතනයකින් 2014 ඔක්තෝබර් 07 දින ලැබුණු රු.3,240,560 ක ප්‍රදානයෙන් රු.152,000 ක් අදාල කාරණයට භාවිතා නොකර, අමාත්‍යාංශයට නෝට් බුක් පරිගණකයක්, ජංගම දුරකථනයක් හා Samsung Galaxy ටැබ් උපකරණයක් මිලදී ගැනීමට වැයකර තිබුණි. තවත් රු.1,107,392 ක් 2015 ජුනි මාසය අවසන් වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.4 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා පැවතීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අඹතලේ ජල පවිත්‍රාගාරයේ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතියට (166-2-5-71) 2014 වර්ෂය සඳහා දේශිය අරමුදලින් (17) රු.මිලියන 3 ක ද, විදේශ ණය (12) රු.මිලියන 3 ක ද ඇස්තමේන්තු ප්‍රතිපාදන තිබුණද, වර්ෂය තුළ කිසිදු වියදමක් කර නොතිබුණි. එසේම 2013 වර්ෂයේදීද මෙම ව්‍යාපෘතියට (166-2-5-39) දේශිය අරමුදලින් රු.මිලියන 50 ක් ද විදේශ ණය රු.මිලියන 150 ක ද ප්‍රතිපාදන සළසා ගෙන තිබු නමුත්, එම වර්ෂය තුළදීද කිසිදු වියදමක් කර නොතිබුණි.

**(ආ)** අමාත්‍යාංශයේ මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම යටතේ වූ ව්‍යාපෘති 6 කට දේශීය අරමුදලින් රු.මිලියන 569 ක් ඇස්තමේන්තු කර තිබුණි. මුදල් රෙගුලාසි 66 මගින් රු. මිලියන 41.9 ක අතිරේක ප්‍රතිපාදන සළසා ගැනීමෙන් පසු වර්ෂ අවසානයේ ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 610.9 විය. එයින් රු. මිලියන 239.4 ක් වර්ෂය අවසානයේ දී ඉතිරි කර ගෙන තිබුණු අතර එම ප්‍රමාණය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 39 ක් වී තිබුණි. අවශ්‍යතාවයට වැඩියෙන් ප්‍රතිපාදන මාරු කර ගැනීම නිසා මෙම ඉතිරිය සිදු වී තිබුණි.

**(ඇ)** ව්‍යාපෘති 08 කට අදාල වැය විෂයයන් 09 ක් සඳහා තිබුණු රු.මිලියන 581.2 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

**(ඈ)** ව්‍යාපෘති 03 කට අදාලව, වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබු රු.මිලියන 700 ක විදේශ ණය, විදේශ ප්‍රදාන හා විදේශ මුල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය සඳහා වූ ප්‍රතිපාදන, ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නොහැකි වීම හා කොන්ත්‍රාත් පිරිනැමීම් ප්‍රමාදවීම යනාදී කළමනාකරණ දුර්වලතා මත, මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන්ට එම ප්‍රතිපාදන මාරුකර තිබුණි.

**(ඉ)** ව්‍යාපෘති වැය විෂයයන් 8 කට මුදල් රෙගුලාසි 66 මගින් මාරුකළ රු.මිලියන 519 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් හෝ එම සළසා ගෙන තිබුණු ප්‍රතිපාදනයද ඉක්මවා රු.මිලියන 1,304 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එසේ සළසා ගත් අතිරේක ප්‍රතිපාදනය මෙන් ඉතිරිය සියයට 251 ක් වී තිබීම හේතුවෙන් අතිරේක ප්‍රතිපාදන සළසා ගැනීමට සඳහන් කර තිබුණු හේතු පදනම් විරහිත විය.

**(ඊ)** ව්‍යාපෘති 04 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.498,322,854 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරියට කොන්ත්‍රාත් පිරිනැමීම ප්‍රමාදවීම හේතු ලෙස දක්වා තිබුණි. ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් පිරිනැමීම ප්‍රමාදවීම එම ව්‍යාපෘතිය අපේක්ෂිත කාලයේ දී නිම කිරීම ප්‍රමාදවීමටත්, ඒ අනුව ව්‍යාපෘතිවල කාලය දීර්ඝ කර ගැනීමට සහ ව්‍යාපෘතිවල වියදම ඉහළයාමටත් හේතු වී තිබුණු බව විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

**3.5 නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ). මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශය සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ). 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය කර නොතිබුණි. |

**3.6 නිෂ්කාර්ය වත්කම්**

ධාවනයට යොදා ගත නොහැකි ත්‍රී වීලර් 07 ක් හා මෝටර් රථ 02 ක් අමාත්‍යාංශ භූමියේ අනාරක්ෂිතව 2014 වර්ෂයේ සිට ගාල්කර තිබුණි.

**3.7 වෙනත් ආයතන සතු වත්කම් අමාත්‍යාංශය විසින් පරිහරණය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු වාහන 11 ක් අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට පරිහරණය කර තිබුණි. 2014 වර්ෂයේදී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එම වාහන වල රක්ෂණය, ආදායම් බලපත්‍ර, අළුත්වැඩියා හා ඩීසල් බදු යනාදියට රු.1,108,564 ක් වැය කර තිබුණි.

**(ආ)** විගණනය සඳහා ඉදිරිපත් කළ අමාත්‍යාංශයේ වාහන ලැයිස්තුව හා වාහන ලියාපදිංචි කිරීමේ පොත් පරීක්ෂා කිරීමේදී අමාත්‍යාංශය ව්‍යාපෘති දෙකකට අයත් වාහන 26 ක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව පාවිච්චියට ගෙන තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 19 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 01 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 80 | 53 | 27 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 37 | 25 | 12 | - |
| (v) | වෙනත් (අනියම්, තාවකාලික) | 04 | 06 | - | 02 |
| | **එකතුව** | **151** | **104** | **49** | **02** |

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

අමාත්‍යාංශය විසින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | කාල පර්ච්ඡේදය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 01 | 2012 අගෝස්තු සිට 2015 සැප්තැම්බර් දක්වා |
| තෘතියික | 02 | 2007 හා 2014 සිට 2015 සැප්තැම්බර් දක්වා |
| ප්‍රාථමික | 04 | 2012 සිට 2015 සැප්තැම්බර් දක්වා |
| **එකතුව** | **07** | |